අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක - 32/2022

මගේ අංකය - ED/4/58/16/08/03(VOL-11)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල

2022.09. 07

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථානමාරු පටිපාටිය - 2022/2023
## ( I , II හා III ශ්‍රේණි)

**1. හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XV111 වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සියළුම නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**(අ) වාර්ෂික ස්ථාන මාරු කමිටුව මඟින්**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ හැරුණු විට අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ විෂයය පථය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයේ පරිපාලනමය හා කළමනාකරණ අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමද වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මගින් ක්‍රියාත්මක කෙරේ. මෙම ස්ථාන මාරුවීම් 2023 වර්ෂයේ මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වේ.

**(ආ) වාර්ෂික නොවන ස්ථාන මාරු**

වාර්ෂික ස්ථාන මාරු කමිටුවලදී හැර දෛනිකව සිදු කෙරෙන කාර්යයක් ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොකෙරේ. එහෙත් පරිපාලනමය අවශ්‍යතා සහ විනය හේතු මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් ලබා දෙනු ලබන ස්ථාන මාරු නියෝගවලට නිලධාරීන් යටත්වේ. නිලධාරීන්ගේ සුහද ස්ථාන මාරු ඉල්ලීම් ද, නිලධාරීන්ගේ සානුකම්පිත ඉල්ලීම් ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ / නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර**

2.1 දැනට සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1,11 සහ111 ශ්‍රේණියේ සියලුම නිලධාරීන් (විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු සහ පළාත් සභාවල සේවය සඳහා මුදාහැර ඇති නිලධාරීන් ද ඇතුළත්ව) අතුරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන්

2.1.1. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් (මධ්‍යම රජයේ) යම් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධරයන්

2.1.2. යම් පළාත් සභාවකට අයත් සේවා ස්ථානයක /ස්ථානවල (පළාත්, කලාප ,කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා පළාත් පාසල්) ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 12 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධරයන්

2.1.3. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට උසස් කර ඇති නමුත් මෙතෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 11 හා 111 තනතුරුවල සේවය කරන නිලධරයන්

2.2 කිසියම් සේවා ස්ථානයක අවම වශයෙන් වසර 03 ට වැඩි සේවා කාලයක් සේවය කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.3 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත පත් කරනු ලබන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විභාග කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්, විදුහල්පති වැනි තනතුරුවලට අදාළව සිදු කරනු ලබන ස්ථාන මාරුවීම් එම තනතුරු සඳහා ස්ථිරව පත් කරන ලද නිලධාරීන් අතර පමණක් සිදු කරනු ලැබේ. තවද, උක්ත තනතුරුවලට ස්ථිරව පත් කරන ලද නිලධාරීන් විශ්‍රාම ගැනීම හෝ වෙනත් හේතු මත එම තනතුරුවල ඇති වන පුරප්පාඩු සඳහා ස්ථාන මාරු පටිපාටිය අනුව ස්ථාන මාරු කිරීම් සිදු නොකරන අතර, සේවා ව්‍යවස්ථානුකූලව එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ඇත.

සටහන :-

i. යම් පළාත් සභාවක් තුළ පිහිටි පළාත්, කලාප, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 12 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එසේම එක් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් පළාත් සභාව තුළ පිහිටි කාර්යාල අතර ස්ථාන මාරු කිරීම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ බලධාරියෙකු විසින් සිදු කරනු ලැබේ.

ii. පළාත් සභාවකට තාවකාලිකව මුදාහැර ඇති නිලධරයෙකු අදාල පළාත් සභාවෙන් පිටතට ස්ථාන මාරු කිරීම අදාළ පළාත් ආණ්ඩුකාරවරයාගේ හෝ පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලැබූ බලධරයාගේ එකඟතාවය ඇතිව සිදු කරනු ලැබේ.

iii.වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ යම් පළාත් සභාවකට තාවකාලිකව මුදාහරිනු ලබන නිලධාරීන් එම පළාත් සභාව තුළ ස්ථානගත කිරීම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් හෝ බලධරයකු විසින් සිදු කරනු ලැබේ.